**ආර්ථික විද්‍යාව - 11 - සංවර්ධනයේ විවිධත්වය විග්‍රහ කරමින් තිරසර සංවර්ධනයට දායක වීමේ ඇල්ම පැහැදිලි කරයි.**

1.න්‍යායාත්මක ප්‍රවේශයක් ඔස්සේ නිර්වචනය කිරීමේදී ආර්ථික වෘද්ධිය යනු,

1.මූර්ත දළ දේශීය නිෂ්පාදිතය අඛණ්ඩව ඉහළ යාමයි.
2.ආර්ථිකයේ භාණ්ඩ හා සේවා නිමැවුම් ධාරිතාව/විභව නිමැවුම ඉහළ යාමයි.
3.මූර්ත නිමැවුම දිගුකාලීනව ප්‍රසාරණය වීමයි.
4.නාමික ජාතික ආදායම ඉහළ යාමයි.
5.මූර්ත දළ දේශීය නිෂ්පාදිතය කෙටි කාලීනව ප්‍රසාරණය වීමයි.

2.ආර්ථික වෘද්ධියේ පිරිවැයක් ලෙස සලකනු නොලබන්නේ,

1.ආර්ථිකයේ උද්ධමනකාරී තත්ත්වයන් පැන නැගීම.
2.ප්‍රාදේශීය විෂමතා හට ගැනීම.
3.පාරිසරික ගැටළු හට ගැනීම.
4.නිෂ්පාදනයේ හා පාරිභෝජනයේ සෘණ බාහිරතා හට ගැනීම.
5. වර්තමාන පරිභෝජනය ඉහළ යාම.

3.තිරසර සංවර්ධනයේ ආර්ථික පැතිකඩට අයත් වන සංරචක අඩංගු නිවැරදි වරණය වනුයේ,

1.සාධාරණත්වය,සහභාගීත්වය,කාර්යක්ෂමතාවය
2.සාධාරණත්වය,ස්ථායීතාවය,සවිබල ගැන්වීම.
3.වෘද්ධිය,කාර්යක්ෂමතාවය,ස්ථායීතාවය
4.සාධාරණත්වය,ස්ථායීතාවය,සම්පත් සුරැකීම.
5.ආර්ථික පැතිකඩ,පාරිසරික පැතිකඩ,සමාජයීය පැතිකඩ

4.ක්‍රය ශක්ති සාම්‍යය ප්‍රතිශීර්ෂ දළ ජාතික ආදායම ගණනය කරනුයේ,

1.රටක නිපදවන භාණ්ඩ හා සේවා ප්‍රමාණය හා ඒ ඒ භාණ්ඩයේ ඩොලර් මිලෙහි ගුණිතය ජනගහන ප්‍රමාණයෙන් බෙදීමෙනි.
2.දළ දේශීය ආදායම/ජාතික ආදායම රටේ මධ්‍ය වාර්ෂික ජනගහනයෙන් බෙදීමෙනි.
3.ඒක පුද්ගල දළ ජාතික ආදායම රටේ මධ්‍ය වාර්ෂික ජනගහනයේ අනුපාතිකයක් ලෙස ගණනයෙනි.
4.ඒක පුද්ගල දළ දේශීය නිෂ්පාදිතය රටේ මධ්‍ය වාර්ෂික ජනගහනයේ අනුපාතිකයක් ලෙස ගණනයෙනි.
5.ඉහත සඳහන් කිසිදු ක්‍රමවේදයකින් නොවේ.

5.සංතුෂ්ටි දර්ශකයට ඇතුළත් නොවන සංරචක දැක්වෙන නිවැරදි වරණය වනුයේ,

1.යහපාලනය,පරිසරය.සංස්කෘතිය
2.මානසික සතුට,කාල කළමනාකරණය,අධ්‍යාපනය

3.අධ්‍යාපනය,මානසික සතුට,සෞඛ්‍යය
4.සහභාගීත්වය,දේශපාලන නිදහස,සාක්ෂරතාවය
5.යහපාලනය,ජීවන තත්ත්වය,මානසික සතුට

6.තිරසර සංවර්ධනය සඳහා වන 2030 න්‍යාය පත්‍රයට අනුව සියලුම ජාතීන් එකඟතාවය පල කළ තිරසර සංවර්ධන ඉලක්ක සංඛ්‍යාව,

1.) 14
2.) 17
3.) 19
4.) 8
5.) 11

7. පහත කල්පිත දත්ත ඇසුරින් පංචමක අපකිරණ අනුපාතිකය ගණනය කරන්න.

- ඉහළ ආදායම් ලබන පන්තියට හිමි මාසික ආදායම - රු.98,575
- පහළ ආදායම් ලබන පන්තියට හිමි මාසික ආදායම - රු.8,211

1.) 0.083
2.) 12
3.) 16
4.) 0.8
5.) 8

8.ලෝරන්ස් වක්‍රය තිරස් අක්ෂය දෙසට විතැන් වීමෙන් අනාවරණය වන්නේ,

1.ආදායම් ව්‍යාප්ති විෂමතාවය වැඩි වී ඇති බවය.
2.ජිනි සංගුණකයේ අගය ඉහළ ගොස් ඇති බවය.
3.රජයේ ආදායම් පුනර්ව්‍යාප්තිය සාර්ථක වී නොමැති බවය.
4.දරිද්‍රතාවය ඉහළ ගොස් ඇති බවයි.
5.ඉහත සඳහන් සියල්ලම අදාළ වේ.

9.කල්පිත ආර්ථිකයක ජනගහනය හා සම්බන්ධ තොරතුරු පහත වගුවේ දැක්වේ.

| | |
|---|---|
| ජනගහනය | 150 |
| සේවා නියුක්තිය | 95 |
| සේවා වියුක්තිය | 5 |
| විශ්‍රාමිකයින් | 60 |
| රැකියා අපේක්ෂා නොකරන්නන් | 8 |

මෙකී ආර්ථිකයේ විරැකියා අනුපාතිකය

1.) 5.3%
2.) 2.9%
3.) 5.0%
4.) 4.8%
5.) 3%

10.පහත සංරචක අතුරින් බහුමාන දරිද්‍රතා දර්ශකය පිළියෙල කිරීම සඳහා යොදා ගන්නා විහීනතා දර්ශකයක් වන්නේ,

1.අඩු බරැති දරු උපත්
2.ඒක පුද්ගල ක්‍රය ශක්ති ආදායම
3.වැඩිහිටි සාක්ෂරතාවය
4.උපතේදී ජීවිත අපේක්ෂාව
5.සනීපාරක්ෂාව

<u>පිළිතුරු</u>

| | |
|---|---|
| **1.)** 2 | **6.)** 2 |
| **2.)** 5 | **7.)** 2 |
| **3.)** 3 | **8.)** 5 |
| **4.)** 1 | **9.)** 3 |
| **5.)** 4 | **10.)** 5 |

<u>**සැකසුම -**</u>

**අයි.කේ.ඒ.කේ.ධනවර්දන මිය,**
**ඒ.ජී.එන්.ආර්.කුමාරි මිය,**
**ර/කුරුවිට ම.ම.වි.**